# කොළඹ ගමන



ටී.එම්.ආයිෂා ශ්‍රී බංඩාර

# කොළඹ ගමන


## වී.එම්.ආයීා ශ්‍රී බංඩාර

කතෘ


**කතෘගේ වෙනත් කෘති**

නංගි යි සරුංගලෙ යි


මහාමයා බාලිකා විදුහල

5 ශ්‍රේණිය A

කෘතිය පළ කරන දිනය 2026 මැයි 10

ISBN : 978-624-211-022-6

# පිදුම

මගේ කෘතිය නිර්මාණය කිරීමට මෙන්ම
මගේ ජීවිතයටම අත්වැල සපයන මගේ
දෙමාපිය දෙපළට හා සහෝදරියට
ආදරයෙන්.....



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමයා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කරුවන් ලෙස දැයට දයාද කරන්නට හැකි වීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි.මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලක් ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මඟ පෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමයා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්‍ය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.


2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.


ප්‍රදීප් නිලංග දැල
දියවඩන නිලමේ
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10



පසුගිය පාසල් නිවාඩු කාලයේ, මම, මගේ නංගි ආරණ්‍යා, අම්මා සහ අප්පච්චි එක්ක කොළඹ ගියා. අපි දුම්රියෙන් ගියා, ඒක හරිම විනෝදයි!

මම ආරණ්‍යා එක්ක කවුළුවක් ළඟ හිදගෙන ගියා. දුම්රිය වේගයෙන් යද්දී, අපිට පිට පැත්තෙන් නිල් පාට මුහුද පේනවා. ආරණ්‍යා කිව්වා, “මුහුද අපි පස්සේ එනවා” කියලා. මට හරිම හිනා ගියා.

මුලින්ම අපි කොළඹ කෞතුකාගාරයට ගියා. ඒක හරිම විශාලයි, පැරණි දේවල් ගොඩක් තිබුණා. මම රන් මාලා, ලොකු පිළිම බලලා, “මම රැජිණක්” කියලා ආරණ්‍යාට කිව්වා. ඇය “මම කුමාරිකාවක්” කියලා කිව්වා.





ඊළඟට අපි ගල්කිස්සේ මුහුදු වෙරළට ගියා. වැල්ල හරිම රස්නෙයි. අපි මුහුදේ සෙල්ලම් කලා, වැලි මාළිගා හැදුවා. ඒත් රළක් ඇවිත් ඒක බිඳලා. ආරණ්‍යා හරිම පුදුම වෙලා බැලුවා, පස්සේ අපි දෙන්නම හිනා උනා.

රාත්‍රියේ අපි සිනමා ශාලාවකට ගියා. මට පොප්කෝන් ගත්තා. මම බෙදාගන්න කැමති නෑ. ඒත් අම්මා මට ආරණ්‍යා එක්ක බෙදාගන්න කිව්වා.

අපි ගල්කිස්සේ හෝටලයක නවාතැන් ගත්තා. අපේ කාමරේ ලස්සනයි, මුහුදේ හඬත් අහන්න පුළුවන්. මට හරිම මහන්සි නිසා ඉක්මනින්ම නින්ද ගියා.

ඊළඟ දවසේ අපි ග්‍රහලෝකාගාරය බලන්න ගියා. ඇතුළේ අඳුරුයි, ඉහළට බැලුවාම තරු පේනවා. ඒක ඇත්තටම අපි අහසට ගියා වගේ.ආරණ්‍යා ටිකක් බය වෙලා මගේ අත අල්ලාගෙන හිටියා.



ඊළඟට අපි නෙලුම් කුළුනේ ඉහළට ගියා. ඉහළින් බැලුවාම හැම දෙයක්ම පොඩියට පේනවා. මම අපි ගිය මුහුද හොයන්න උත්සාහ කළා.



අවසානයේ අපි OneGalleface කියලා සාප්පු ගොඩාක් තියන ගොඩනැගිල්ලකට ගියා. අපි රසවත් කෑම කෑවා, පොඩි තෑගි ගත්තා. මට ලස්සන රෝස පාට සපත්තු ජෝඩුවක් ලැබුණා, ආරණ්‍යාට මෘදු බෝනික්කෙක් ලැබුණා.

ආපහු ගෙදර යන දුම්රියේ, ආරණ්‍යා අම්මාගේ උකුළේ  උඩ නිදා ගත්තා. මම කවුළුවෙන් එළිය බලලා හිතුවා...

මේක තමයි මගේ හොඳම සංචාරය...
මොකද මගේ පවුල මා එක්ක හිටියා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපඥයන්ගේ පිළිගැනීමයි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල් නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොත්පත් ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

නවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උර දී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත්, යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් හා සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද, දියවඩන නිළමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාළිගාවේ කාර්‍ය මණ්ඩලයට ද මෙම සද්කාර්‍ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)